මාධ්‍ය නිවේදනය

**PRESS RELEASE**

Chittampalam A. Gardiner Mawatha, Colombo 02
+94 11 213 5400 /+94 11 213 5300 /+94 11 213 5000
cgir@ird.gov.lk

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
**உள்நாட்டு இறைவரித் திணைக்களம்**
**INLAND REVENUE DEPARTMENT**

දිනය : 2024.11.28

# බදු ගෙවන්නන්ගේ දැන ගැනීම සඳහා

බදු ගෙවන්නන් විසින් තක්සේරු වර්ෂ 2023/2024 සඳහා මාර්ගගත ක්‍රමය හරහා ආදායම් වාර්තා ඉදිරිපත් කිරීමේ දී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

- සේවා නියුක්ති ආදායම හා පොලී ආදායම් පිළිබඳ තොරතුරු මේ වන විට පද්ධතිය තුළ යාවත්කාලීන කර ඇති බැවින් එම තොරතුරු තක්සේරු වර්ෂය තුළ ලද මුළු සේවා නියුක්ති ආදායම සහ මුළු පොලී ආදායම අනුව නිවැරදිව සටහන් වී ඇත්දැයි පරීක්ෂා කර බලන්න.

- සේවා නියුක්ති ආදායම පිළිබඳ තොරතුරු ඇතුළත් වී නොමැති නම් හෝ ඇතුළත් කර ඇති තොරතුරු නිවැරදිව නොවේ නම් සේවායෝජක විසින් ලබාදී ඇති T-10 සහතික පත්‍රයේ තොරතුරු භාවිතා කර සේවායෝජකගේ නම, ලිපිගොනු අංකය (TIN) සහ වර්ෂය තුළ ලද සේවා නියුක්ති ආදායම ඇතුළත් කරන්න. එසේම පරිලෝකනය (Scan) කරන ලද එම T-10 සහතිකය උඩුගත කරන්න.





**Primary Employment**

| | | |
|---|---|---|
| TIN of the employer | a | [redacted] |
| Employer/company name | b | [redacted] |
| Remuneration (Rs.) | c | 1,500,000.00 |
| APIT paid on Employment income (Rs.) | d | 18,000.00 |
| Total exempt / Excluded employment income (Rs.) | e | |



- පද්ධතියේ සඳහන් තොරතුරුවලට අමතරව තවත් පොලී ආදායම් ඇත්නම්, ඒවායේ තොරතුරු පහත පරිදි ඇතුළත් කළ යුතුය. ඒ සඳහා රඳවා ගැනීමේ බදු නියෝජිතයා විසින් නිකුත් කළ රඳවා ගැනීමේ බදු සහතිකවල තොරතුරු භාවිතා කළ හැකිය.



**Interest Income**

A - Advance income tax / withholding tax deducted by the withholding agent

| | Source/type | TIN of the Withholding Agent | AIT/WHT certificate No. | Amount received (Rs.) | Date of payment | AIT/ WHT deducted by the withholding agent (Rs.) |
|---|---|---|---|---|---|---|
| ☐ | I-INTEREST | [redacted] | 1.00495E+11 | 264.40 | | 13.22 |
| ☐ | I-INTEREST | | 100495214001 | 1,461.73 | | 73.09 |
| ☐ | I-INTEREST | | 0100495214001 | 1,094.40 | | 54.72 |
| ☐ | I-INTEREST | | 0100495214001 | 1,212.98 | | 60.65 |
| ☐ | I-INTEREST | | 100495214001 | 805.89 | | 40.29 |
| ☐ | I-INTEREST | | 100495214001 | 805.89 | | 40.29 |
| | | | | 7,314.94 | | 365.74 |

Add Remove

Total Exempt / Excluded Interest Income (Rs.) f

- රඳවා ගැනීමේ බදු අඩුකිරීමේ සහතිකයේ එම බද්ද අඩු කළ රඳවා ගැනීමේ බදු නියෝජිතයාට හිමි බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) හා සහතිකපත් අංකය ඇතුළත් කිරීම අනිවාර්යය වුවත්, ඒවා සටහන්ව නොමැති නම්, බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) සඳහා 999999999 හා සහතිකපත් අංකය WHT/AIT/2324 ලෙස ඇතුළත් කරන්න.




- ඔබගේ රඳවාගැනීමේ බදු වලට අදාළ පරිලෝකනය (Scan) කර ආදායම් බදු වාර්තාව සමඟ උඩුගත කරන්න. වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේ දී එම සහතිකපත් ඔබ වෙත නොමැති නම් වාර්තාව ඉදිරිපත් කර මාසයක් ඇතුළත ඒවා දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය වෙත උඩුගත කළ යුතුය.

- ආදායම් බදු වාර්තාව මාර්ගගත ක්‍රමය හරහා ලබා දීම අනිවාර්යය වන අතර, එසේ කිරීමට විශේෂිත අපහසුතාවක් ඇති යම් පුද්ගලයෙකුට ලිඛිත ඉල්ලීමක් මඟින් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියට යටත්ව ආදායම් වාර්තාව පුරවා අතින් භාර දිය හැකිය.

කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ. සේපාලිකා චන්ද්‍රසේකර
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ-02.